# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2413/44 - 2024 දෙසැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2024.12.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2025 වර්ෂය සඳහා නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම

ජනමාධ්‍ය ආයතනවල හා මාධ්‍ය වෘත්තිකයන්ගේ කාර්යභාරය මනාව ඉටුකිරීමට අවශ්‍ය නිදහස් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීමේ රජයේ වගකීමට අනුගතව යහපත් හා ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් වෙනුවෙන් කැපවී සිටින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මක බව වර්ධනය කරමින් ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමත්, ස්වකීය මාධ්‍ය මෙහෙවර බාධාවකින් තොරව කරගෙන යාමට සහායවීමත් පිණිස වෘත්තීය මාධ්‍යවේදීන්ට නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරයි.

මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යයේදී, "ප්‍රවෘත්ති හා තොරතුරු රැස්කරන, රචනා කරන, සංස්කරණය කරන, සපයාගත් තොරතුරු මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් මාධ්‍ය ඔස්සේ ග්‍රාහකයා වෙත සන්නිවේදනය කරන තැනැත්තා" මාධ්‍යවේදියකු ලෙස සළකනු ලැබේ. මාධ්‍යවේදී හැඳුනුම්පත් නිකුත් කරනුයේ එම කාර්යයන්වල නිරත මාධ්‍ය වෘත්තිකයන්ට පමණි.

මේ යටතේ පහත වෘත්තිකයන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

I. මාධ්‍ය ආයතනවල සේවයේ නිරත කළමනාකරණ සහකාර / සම්බන්ධීකාරක වැනි සෘජුවම මාධ්‍යවේදයට අදාළ නොවන තනතුරු දරන්නන්

II. ප්‍රචාරක ආයතන, වෙළෙඳ දැන්වීම් හා වීඩියෝ නිෂ්පාදන ආයතන, ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා නොකරන මාධ්‍ය ආයතනවල වෘත්තිකයන්

III. සිනමා / ටෙලි නාට්‍ය / වේදිකා නාට්‍ය වැනි ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රවල නිරත ශිල්පීන්

**01. මාධ්‍ය හැඳුනුම්පත් සඳහා වන අයැදුම්පත් නිර්දේශ කිරීම සඳහා වන පොදු උපදෙස්**

I. මෙම මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා වන අයැදුම්පත් නිර්දේශ කිරීමේදී තම මාධ්‍ය ආයතනයේ සේවය කරන වෘත්තීය මාධ්‍යවේදීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත් පමණක් නිර්දේශ කිරීමට සියලුම මුද්‍රිත, විද්‍යුත් හා වෙබ් මාධ්‍ය ආයතන ප්‍රධානීන් හා ඔවුන්ගේ බලයලත් නිලධාරීන් වගබලා ගත යුතුය.


1A - G 43197 — 06 (2024/12)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II. ඔබ ආයතනයට අදාළ මාධ්‍යවේදීන්ගේ / මාධ්‍ය වෘත්තිකයන්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම සඳහා බලයලත් නිලධාරියෙකු නම් කරන්නේනම්, අදාළ බලයලත් නිලධාරියාගේ නම, ජාතික, හැඳුනුම්පත් අංකය, තනතුර, රාජකාරි දුරකථන අංකය, ආදර්ශ අත්සන හා නිල මුද්‍රාව යන තොරතුරු 2025 වර්ෂය ආරම්භයේ දී ම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය වෙත එවීම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී පහසුවකි. එලෙස නම් කරනු ලබන නිලධාරියා කිසියම් හේතුවක් මත වෙනස් කළ යුතු වන්නේ නම්, අලුතින් නම් කරනු ලබන නිලධාරියාගේ තොරතුරු කඩිනමින් එවන ලෙස මාධ්‍ය ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිමි.

III. තම මාධ්‍ය ආයතනයේ මාධ්‍යවේදීන් / මාධ්‍ය වෘත්තිකයෙක් නොවන අභ්‍යාසලාභීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් කිසිසේත්ම නිර්දේශ නොකළ යුතු ය. (අභ්‍යාසලාභීන්ට කිසිදු හේතුවක් මත මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.)

IV. අයදුම්පත් සමග පහත ආකෘතිය අනුව සැකසූ වගුවක ඔබ ආයතනයේ මෙකී අයදුම්පත් ඉදිරිපත් කරන මාධ්‍යවේදීන්/ මාධ්‍ය වෘත්තිකයන්ගේ තොරතුරු ඇතුළත් කර ("වගු අංක 01" අනුව), ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ අදාළ තොරතුරු සනාථ කර ඔවුන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම නිර්දේශ කරන බව දන්වමින් අදාළ මාධ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව යෙදූ ආවරණ ලිපියක් එවිය යුතුය. එසේ නොවන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| අනු අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුර | සේවය කරන අංශය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

(වගු අංක 01)

V. ඔබ ආයතනය මගින් අයදුම්පත් ඉදිරිපත් කරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ තොරතුරු ඇතුළත් කර ("වගු අංක 02" අනුව), ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ අදාළ තොරතුරු සනාථ කිරීමට හා ඔවුන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම නිර්දේශ කරන බව දන්වමින් අදාළ මාධ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන හා නිල මුද්‍රාව යෙදූ ආවරණ ලිපියක් එවිය යුතුය. එසේ නොවන සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙහිදී, අදාළ තොරතුරු දිස්ත්‍රික් වශයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු ය. එසේම මෙම නාමලේඛනයේ මෘදු පිටපත (Soft Copy) media.accre@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය. (දැනට ප්‍රවෘත්ති සපයන සක්‍රීය වාර්තාකරුවන්ගේ නම් පමණක් නාමලේඛනයට ඇතුළත් කිරීමට මාධ්‍ය ආයතන ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලයලත් නිලධාරීන් වගබලා ගත යුතුය.)

| අනු අංකය | ප්‍රාදේශීය මාධ්‍යවේදියාගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ස්ථිර ලිපිනය | මාධ්‍යවේදියාගේ දුරකථන අංකය / අංක | වාර්තාකරු ආවරණය කරන දිස්ත්‍රික්කය හා ප්‍රදේශය |
|---|---|---|---|---|---|
| 01 | | | | | |
| 02 | | | | | |

(වගු අංක 02)

VI. මාධ්‍ය හැඳුනුම්පත ලබා ගැනීම සඳහා මාධ්‍ය ආයතන ඉදිරිපත් කරන නාමලේඛන හා එහි ඇතුළත් තොරතුරු පිළිබඳ පූර්ණ වගකීම එය සහතික කරන මාධ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරියා වෙත පැවරේ. මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම ඇතුළත් ලිපිය සහතික කරන තැනැත්තා නාමලේඛනයේ සෑම පිටුවක්ම සිය අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කළ යුතුය.

VII. මෙම සමස්ත නාමලේඛනවලට අමතරව, සෑම අයදුම්පතක්ම වෙන් වෙන් වශයෙන් මාධ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරී විසින් ස්වකීය අත්සන හා නිල මුද්‍රාව තබා නිර්දේශ කළ යුතුය.

VIII. මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ වර්ෂයකට එක්වරක් පමණි. ආයතන විසින් වරින්වර ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සලකා නොබලන අතර එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලබයි.

IX. මාධ්‍ය ආයතනයක සේවයෙන් ඉවත් කරනු ලබන / ඉවත්ව යන මාධ්‍යවේදියකුගේ හැඳුනුම්පත, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත නැවත භාරදීම මාධ්‍ය ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේය. එලෙස භාරදීමෙන් තොරව ඒ වෙනුවට පත් කරනු ලබන වෙනත් තැනැත්තකු වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකරන අතර එවැනි අයදුම්පත් නිර්දේශ නොකිරීමට අදාළ මාධ්‍ය ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරී වගබලා ගත යුතුය.

X. පෞද්ගලික අභිමතාර්ථ සාධනය පිණිස මෙම ජනමාධ්‍ය හැඳුනුම්පත් අවභාවිතය පිළිබඳ පැමිණිලි ලදහොත්, ඒ පිළිබඳව විමර්ශනය කර අදාළ හැඳුනුම්පත් අවලංගු කිරීමේ පූර්ණ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය. එවැනි අවස්ථාවකදී, එලෙස අවලංගු කරන ලද හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුගේ හෝ දැනුම්දීමක් මත, දින දෙකක් ඇතුළත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ගෙනවිත් භාර දීමට, එම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරන ලෙස නිර්දේශ කළ ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ බලයලත් නිලධාරියාගේ වගකීමක් වන්නේය.

**02. මාධ්‍ය හැඳුනුම්පත් අයැදුම් කිරීමේ දී අයැදුම්කරුවන් විසින් අවධානයට ගත යුතු මූලික කරුණු හා මාධ්‍ය හැඳුනුම්පත් වර්ගීකරණය**

I. 2025 වර්ෂය සඳහා පහත සඳහන් වර්ගීකරණ යටතේ මෙහි ඒ ඒ හැඳුනුම්පත් වර්ගවලට අදාළව මතු දැක්වෙන නිර්ණායක අනුව මෙම නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරයි. අයැදුම්පත් ඉදිරිපත් කිරීමේදී අයැදුම්කරුවන් හා හැඳුනුම්පත් නිර්දේශ කරන්නන් ඒ පිළිබඳව ස්වකීය අවධානය යොමු කළ යුතුය.

| | | |
|---|---|---|
| අ. | මාණ්ඩලික මාධ්‍යවේදී | (Journalist) |
| ආ. | ප්‍රාදේශීය මාධ්‍යවේදී | (Provincial Journalist) |
| ඇ. | නිදහස් මාධ්‍යවේදී | (Freelance Journalist) |
| ඈ. | විදේශීය මාධ්‍යවේදී (තාවකාලික) | (Foreign Journalist) - (Temporary) |
| ඉ. | මාධ්‍ය පරිපාලක | (Media Administrator) |
| ඊ. | තාක්ෂණික ශිල්පී | (Technical) |
| එ. | මාධ්‍ය සේවා | (Media Services) |

II. යම් මාධ්‍ය ආයතනයක් වෙනුවෙන් වලංගු කාලය ඉක්ම නොවූ නිල මාධ්‍ය හැඳුනුම්පතක් ලද මාධ්‍යවේදියෙක් / මාධ්‍ය වෘත්තිකයෙක් එම හැඳුනුම්පතෙහි සඳහන් මාධ්‍ය ආයතනයේ සේවයෙන් ඉවත් වූ /ඉවත් කරනු ලැබූ විට එම නිල මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දීමෙන් අනතුරුව පමණක් එම තැනැත්තාට වෙනත් මාධ්‍ය ආයතනයක් වෙනුවෙන් හෝ නිදහස් ජනමාධ්‍යවේදියෙක් ලෙස නව හැඳුනුම්පතක් නිකුත් කරනු ලබයි. එවැනි මාධ්‍යවේදියෙක් / මාධ්‍ය වෘත්තිකයෙක් අයැදුම්පත් ඉදිරිපත් කිරීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

III. පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනම මත ජනමාධ්‍යවේදියකු / මාධ්‍ය වෘත්තිකයෙක් ලෙස අවම වශයෙන් මාස 06 කට වැඩි කාලයක් සේවයේ නිරතව සිටින අය පමණක් මෙම නිල මාධ්‍ය හැඳුනුම්පත ඉල්ලුම් කළ යුතු ය. (අභ්‍යාසලාභීන්ට හා පුහුණුවන්නන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.)

IV. සියලු අයැදුම්කරුවන් තම අයැදුම්පත සමග තම නිල රාජකාරි හැඳුනුම්පතෙහි පිටපතක් හා ජාතික හැඳුනුම්පතේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හෝ වලංගු රියැදුරු බලපත්‍රයේ හෝ පිටපතක් ස්වකීය ආයතන ප්‍රධානී විසින් සිය නම, තනතුර හා මාධ්‍ය ආයතනයේ නම සහිත නිල මුද්‍රාවක් තබා තම අත්සන යොදා සහතික කර ඉදිරිපත් කළ යුතු ය. (එසේම අවශ්‍ය වුවහොත්, යම් අයැදුම්කරුවෙකුගේ නිල රාජකාරි හැඳුනුම්පත පරීක්ෂා කිරීමේ බලය ද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන් සතු ය.)

V. කාර්යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවක දී අයැදුම්කරුගේ ආයතන ප්‍රධානීන් විසින් සිය නම, තනතුර හා මාධ්‍ය ආයතනයේ නම සහිත නිල මුද්‍රාවක් තබා තම අත්සන යොදා සහතික කරන ලද පත්වීම් ලිපියෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

VI. අයැදුම්පතේ සියලු කොටස් පැහැදිලි අත්අකුරින් හෝ මුද්‍රණය කොට හෝ නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය. අපැහැදිලි, අසම්පූර්ණ අයැදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීමට අවශ්‍ය නම් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයැදුම්පත නැවත ඉදිරිපත් කළ යුතු ය.

VII. අයැදුම් කරන දින සිට ලිත් මාසයක් ඇතුළත ලබාගත් හා කිසිදු ලෙසකින් සංස්කරණය නොකළ, අඟල් 1x1 ½ (සෙ. මී. 2.6 x සෙ. මී. 3.7) ප්‍රමාණයේ පැහැදිලි වර්ණ ඡායාරූප දෙකක් අයැදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. ඉන් එක් ඡායාරූපයක් අයැදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබිය යුතු අතර, අනෙක් ඡායාරූපය පළුදු නොවන පරිදි කවරයක බහා අයැදුම්පතට අමුණා තිබිය යුතු ය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය අපේක්ෂිත තත්ත්වයෙන් යුතු ඡායාරූප අමුණා නොමැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත පරිමාණයන්ට අනුකූලව නොවන හා අපැහැදිලි තත්ත්වයේ ඡායාරූප සහිත අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

VIII. ගෞරව නාම හා අධ්‍යාපන සුදුසුකම් මාධ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් නොකෙරේ. මාධ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් කරනුයේ මාධ්‍යවේදියාගේ නම සහ වෘත්තීය තොරතුරු පමණි.

IX. අන්වර්ථ නාම යටතේ ප්‍රවෘත්තිමය හෝ විශේෂාංග ලිපි/ වැඩසටහන්වල පිටපත් රචනා මාධ්‍යවේදීන් සඳහා එම අන්වර්ථ නාමයන්ගෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

X. මෙම මාධ්‍ය හැඳුනුම්පත ලබාගැනීම සඳහා අයැදුම්පත් ඉදිරිපත් කිරීමේදී මෙහි 03 වන වගන්තියෙහි ඇති කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කර තමන්ට අදාළ හැඳුනුම්පත් වර්ගය හඳුනාගෙන ඊට නියමිත ආකෘතියෙන් යුතු අයැදුම්පත පමණක් ඉදිරිපත් කිරීමට අයැදුම්කරු වගබලා ගත යුතු ය. නියමිත ආකෘතියට අනුකූලව ඉදිරිපත් නොකරන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. එක් එක් වර්ගවලට අයත් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ නිර්ණායක, අයැදුම් කළ යුතු ආකාරය හා ඉදිරිපත් කළ යුතු අමතර ලේඛන**

**අ. මාණ්ඩලික මාධ්‍යවේදී (Journalist)**

I. මුද්‍රිත (පුවත්පත්, සඟරා හා වාර ප්‍රකාශන), විද්‍යුත් (රූපවාහිනී හා ගුවන්විදුලි) හා වෙබ් මාධ්‍ය ආයතනවල ආයතනගතව සේවය කරන මාධ්‍යවේදීන්ට මෙම මාණ්ඩලික මාධ්‍යවේදී **(Journalist)** හැඳුනුම්පත් නිකුත් කරයි.

II. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයැදුම්පත් සමග මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයැදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතු ය.

III. මෙහි දී එක් එක් වර්ගවල මාධ්‍ය ආයතන සඳහා පහත කොන්දේසි අදාළ වේ.

**a) පුවත්පත්, සඟරා හා වාර ප්‍රකාශන ආයතන**

- මාධ්‍ය හැඳුනුම්පත් සඳහා ඉල්ලුම් කරන පුවත්පත/ සඟරාව/ වාර ප්‍රකාශනය අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන බව තහවුරු කරනු පිණිස, මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කරන දින සිට පූර්වාසන්න මාස 06ක කාලයක් දක්වා පළ කළ පිටපත් (අවශ්‍යතාවය අනුව පමණි) සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

- මාධ්‍ය හැඳුනුම්පත් ඉදිරිපත් කරන සෑම පුවත්පතක්, සඟරාවක්/ වාර ප්‍රකාශනයක් සඳහාම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

- යම් පුවත්පතක් සමග ප්‍රකාශයට පත් කෙරෙන අතිරේක වෙනම පුවත්පත් ලෙස නොසලකන අතර එවැනි අයැදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ප්‍රධාන පුවත්පත නමින් පමණි. (මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලබන්නේ ප්‍රධාන පුවත්පතේ නමින් මිස අතිරේකවල නමින් නොවේ.)

- මාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 03ක්, ද්විමාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 02ක් හා ත්‍රෛමාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 01ක් පමණක් නිකුත් කරනු ලැබේ. සය මාසික හෝ වාර්ෂික වාර ප්‍රකාශන/ සඟරා ආදිය සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

- විවිධ විෂයය ක්ෂේත්‍රවලට අදාළව පළ කෙරෙන අත්පොත් (Handbooks) හෝ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරුවලින් බැහැර ප්‍රකාශනවල වෘත්තිකයන් සඳහා මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

**b) විද්‍යුත් (ගුවන්විදුලි හා රූපවාහිනී) මාධ්‍ය ආයතන**

- මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කරන ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය ආයතන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශය විසින් විද්‍යුත් විකාශන සේවා සඳහා නිකුත් කරන බලපත්‍රවල පිටපත් ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් ස්වකීය නම, අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කර ඉදිරිපත් කළ යුතු ය.

- සතියකට අවම වශයෙන් ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් 05ක් හෝ විකාශනය කරන කේබල් රූපවාහිනී (Cable TV) ආයතන, චන්ද්‍රිකා රූපවාහිනී (Satellite) ආයතන හා අන්තර්ජාල පදනම් රූපවාහිනී (IPTV) ආයතනවල ප්‍රවෘත්ති අංශයේ මාධ්‍යවේදීන් සඳහා පමණක් (උපරිමය 10කට යටත්ව) මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරයි. මෙහිදී අදාළ ආයතන නම නාලිකාවේ වැඩසටහන් විස්තරයක් ඉදිරිපත් කළ යුතු ය.

- එසේම මාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන කේබල් රූපවාහිනී (Cable TV) ආයතන, චන්ද්‍රිකා රූපවාහිනී (Satellite TV) ආයතන හා අන්තර්ජාල පදනම් රූපවාහිනී (IPTV) ආයතන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශය විසින් විද්‍යුත් විකාශන සේවා සඳහා නිකුත් කරන බලපත්‍රවල පිටපත් ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් ස්වකීය නම, අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කර ඉදිරිපත් කළ යුතු ය.

**c)** වෙබ් මාධ්‍ය ආයතන

- ප්‍රවෘත්ති සැපයීම මූලික කරගත් වෙබ් අඩවිවල මාධ්‍යවේදීන් සඳහා පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරයි.

- ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ 2025 වසර වෙනුවෙන් ලියාපදිංචි කරන ලද, ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා කරන වෙබ් අඩවිවල සේවයේ නිරත මාධ්‍යවේදීන්ට පමණක් (වෙබ් සභාපති/ වෙබ් අඩවි පාලක/ ගවනර්/ පරිපාලන අධ්‍යක්ෂ වැනි පරිබාහිර තනතුරු සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.) මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ. (ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයැදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතු ය.)

- මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කරන සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියක්ම මාධ්‍ය ආයතනයක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය (Business Registration) ලබා තිබිය යුතු ය. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් ස්වකීය නම, අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කර ඉදිරිපත් කළ යුතු ය.)

- මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී අදාළ වෙබ් අඩවියේ සක්‍රීය බව, අරමුණු, ග්‍රාහක සංඛ්‍යාව දිනපතා යාවත්කාලීන කිරීම් හා වෙනත් අදාළ කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කෙරේ.

- මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අවම මාස හයක කාලයක්, දෛනිකව හා අඛණ්ඩව යාවත්කාලීන කරනු ලැබූ වෙබ් අඩවි පමණක් මේ සඳහා සුදුසුකම් ලබන අතර වෙබ් අඩවියේ පළ කෙරෙන වාර්තා අතුරින් අවම 50% ක අන්තර්ගතයක් අනිවාර්යෙන්ම ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු විය යුතු ය.

- එක් වෙබ් අඩවියකට එක් භාෂා මාධ්‍යයක් වෙනුවෙන් නිකුත් කෙරෙන උපරිම හැඳුනුම්පත් සංඛ්‍යාව 02කි.

- මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම පිණිස වෙබ් මාධ්‍යවේදීන් ඉදිරිපත් කරන යම් අයැදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කර ගැනීම අවශ්‍ය බවට හැඟී යන අවස්ථාවන් හි දී, එම අයැදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

- රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය අනුබද්ධිත ආයතන ඇතුළු රාජ්‍ය ආයතනයකට අයත් ආයතනික වෙබ් අඩවිවලට අනුයුක්ත වෘත්තිකයන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.

**d)** විදේශීය මාධ්‍ය ආයතන

- ජාත්‍යන්තරව පිළිගත් විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකාවේ නියෝජිතයන්/ වාර්තාකරුවන් ලෙස එම ආයතන විසින් පත්කරනු ලැබ, ස්ථිර වශයෙන්ම අදාළ මාධ්‍ය ආයතනයේ සේවය කරන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

- අයැදුම්කරු විසින් සපයනු ලබන තොරතුරු අදාළ විදේශ මාධ්‍ය ආයතනය වෙතින් තවදුරටත් තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් හැඳුනුම්පත නිකුත් කෙරේ.

- අයැදුම්කරු තම මාධ්‍ය ආයතනයේ සේවය කරන බවට අදාළ විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය අයැදුම්පත සමග අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු ය.

- විදේශ මාධ්‍යවේදී හැඳුනුම්පත් ලබා ගැනීම පිණිස ඉදිරිපත් කෙරෙන යම් අයැදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කර ගැනීම අවශ්‍ය බවට හැඟීයන අවස්ථාවන්හි දී, එම අයැදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, අවශ්‍ය වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

ආ. ප්‍රාදේශීය මාධ්‍යවේදී **(Provincial Journalist)**

I. 2025 දෙසැම්බර් 31 දක්වා වලංගු වන පරිදි මාධ්‍ය හැඳුනුම්පත් දැනටමත් නිකුත්කර ඇති ප්‍රාදේශීය මාධ්‍යවේදීන් හැර අනෙකුත් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් පමණක් 2025 වර්ෂය වෙනුවෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

II. වෙබ් මාධ්‍ය ආයතන වෙනුවෙන් නිකුත් කරනු ලබන උපරිම මාධ්‍ය හැඳුනුම්පත් සංඛ්‍යාවට යටත්ව පමණක් එම මාධ්‍ය ආයතනවල ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කෙරේ.

III. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

IV. අයදුම්පත් යොමු කිරීමේදී, අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ප්‍රාදේශීය මාධ්‍යවේදී හැඳුනුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

ඇ. නිදහස් මාධ්‍යවේදී **(Freelance Journalist)**

I. අවම වශයෙන් වසරක කාලයක් අඛණ්ඩව නිදහස් මාධ්‍යවේදියකු ලෙස ජාතික මට්ටමින් පිළිගත් මුද්‍රිත, විද්‍යුත් හෝ වෙබ් මාධ්‍ය ආයතනයක සේවය කර තිබිය යුතුය.

II. නිදහස් මාධ්‍යවේදී හැඳුනුම්පත ලබා ගැනීම සඳහා යොමු කරන අයදුම්පත සමග තමා විසින්, ප්‍රවෘත්ති, විශේෂාංග ලිපි සපයනු ලබන හෝ කාලීන වැඩසටහන් සඳහා දායකවන ආයතන අතරින් අවම වශයෙන් එක් ආයතනයකින් හෝ එකී මාධ්‍ය ආයතනය වෙත අඛණ්ඩව ප්‍රවෘත්ති සපයන බවට එම ආයතනයේ ලිපි ශීර්ෂයකින් අදාළ මාධ්‍ය ආයතනයේ ප්‍රධානී හෝ බලයලත් නියෝජිත විසින් ඔහුගේ නිල මුද්‍රාව තබා අත්සන් කළ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

III. එසේම, ඒ බව තහවුරු කිරීමට, අයදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස හයක කාලයක් ඇතුළත තම නමින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා/ විශේෂාංග/ විචිත්‍රාංග/ ඡායාරූප ආදිය අවම වශයෙන් දොළහකට නොඅඩු සංඛ්‍යාවක සහතික කරන ලද ඡායා පිටපත් හෝ සංයුක්ත තැටි හෝ ඉදිරිපත් කළ යුතුය.

IV. වෙබ් මාධ්‍ය ආයතන වෙනුවෙන් නිකුත් කරනු ලබන උපරිම මාධ්‍ය හැඳුනුම්පත් සංඛ්‍යාවට යටත්ව පමණක් වෙබ් මාධ්‍ය ආයතන සඳහා නිදහස් මාධ්‍යවේදී (Freelance Journalist) හැඳුනුම්පත් නිකුත් කෙරේ.

V. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

ඈ. විදේශීය මාධ්‍යවේදී - තාවකාලික **(Foreign Journalist – Temporary)**

I. ප්‍රවෘත්ති හා කාලීන වැදගත්කමක් සහිත විශේෂ අවස්ථා ආවරණය, ලිපි සම්පාදනය සහ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුත් වාර්තා වැඩසටහන් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන්ට "විදේශීය මාධ්‍යවේදී - තාවකාලික" මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

II. අයදුම්කරු විසින් සිය අයදුම්පත සමග තමා සේවය කර විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත ලිපිය ඉදිරිපත් කළ යුතුය.

III. අයදුම්කරු තම වලංගු විදේශ ගමන් බලපත්‍රය සහ එහි බලපත් හිමියාගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් පිටුවේ ඡායාපිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

IV. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතු ය. විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය මේ සඳහා ඉදිරිපත් කළ නොහැක.

ඉ. මාධ්‍ය පරිපාලක **(Media Administrator)**

I. ජාතික මට්ටමින් පිළිගත් මාධ්‍ය ආයතනයක මාධ්‍ය පරිපාලනයට සෘජුවම දායකවන මාධ්‍ය පරිපාලකයන් (උපරිම වශයෙන් එක් මාධ්‍ය ආයතනයක තිදෙනෙකු සඳහා පමණි) වෙත මෙම මාධ්‍ය පරිපාලක හැඳුනුම්පත නිකුත් කෙරේ.

II. මාධ්‍ය ආයතනවල අලෙවි ප්‍රවර්ධන අධ්‍යක්ෂ / කළමනාකරු / සුබසාධක නිලධාරී හෝ අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රයේ නිරත වෙනත් නිලධාරීන් සඳහා මෙම හැඳුනුම්පත නිකුත් නොකෙරේ.

III. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

ඊ. තාක්ෂණික ශිල්පී **(Technical)**

I. විද්‍යුත් මාධ්‍ය ආයතනවල ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ කාර්යයෙහි සෘජුවම නිරතවන තාක්ෂණික ශිල්පීන් සඳහා මෙම හැඳුනුම්පත නිකුත් කරයි.

II. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

එ. මාධ්‍ය සේවා **(Media Services)**

I. මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශවල නියමය අනුව ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ සඳහා සෘජුවම දායක වන මාධ්‍ය රාජකාරිවලට අදාළ තනතුරු දරන්නන් වෙනුවෙන් මෙම මාධ්‍ය සේවා හැඳුනුම්පත නිකුත් කෙරේ.

II. මෙම වර්ගය යටතේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සමඟ මෙම *ගැසට්* නිවේදනයේ 02. VII වගන්තිය අනුව අදාළ අයදුම්කරුගේ ඡායාරූප ඉදිරිපත් කළ යුතුය.

**04. පොදු කොන්දේසි**

I. මාධ්‍ය හැඳුනුම්පත මාධ්‍ය කාර්යයන් සඳහා පමණක් භාවිත කළ යුතුය. අවභාවිතය හෝ ජනමාධ්‍ය ආචාරධර්මවලට පටහැනිව ක්‍රියාකිරීම් වාර්තා වුවහොත් මාධ්‍ය හැඳුනුම්පත අවලංගු කිරීමේ හෝ මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදෙන ලෙස නියෝග කිරීමේ හෝ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

II. 2025 වර්ෂය වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් භාරගැනීම 2025 මාර්තු 31 දින අවසන් කෙරේ. ඉන්පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත් www.dgi.gov.lk හෝ www.news.lk යන වෙබ් අඩවිවලින් බාගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.

IV. අස්ථානගත වූ මාධ්‍ය හැඳුනුම්පතක් වෙනුවට අදාළ වර්ෂය වෙනුවෙන් නව මාධ්‍ය හැඳුනුම්පතක් ඉල්ලුම් කිරීමේදී අදාළ මාධ්‍ය හැඳුනුම්පත අස්ථානගත වූ බවට වන පොලිස් පැමිණිල්ලේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

V. පෞද්ගලික අභිමතාර්ථ සාධනය පිණිස මාධ්‍ය හැඳුනුම්පත් අවභාවිතය පිළිබඳ පැමිණිලි ලදහොත් විමර්ශනය කර අදාළ මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය හැඳුනුම්පත් අවලංගු කිරීමේ පූර්ණ බලය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

VI. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ අවසාන තීරණය සේම ඉහත කොන්දේසි හා අවශ්‍යතා කාලීන වශයෙන් වෙනස් කිරීමේ බලය ද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතුය.

**එච්.එස්.කේ.ජේ. බණ්ඩාර,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2024 දෙසැම්බර් මස 05 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

EOG 12 - 0057

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.